**ජාතික විද්‍යා පදනම - 2017**

**----------------------------------**

ජාතික විද්‍යා පදනමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1994 අංක 11 දරන විද්‍යා තාක්ෂණ සංවර්ධන පනතේ 40 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර පදනමේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික විද්‍යා පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ලැබිය යුතු ගිණුම්

පර්යේෂණ ප්‍රදානයකින් ඉතිරි මුදලක් වේ නම් ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතිය අවසන් වී දින 30 ක් ඇතුළත එම මුදල ප්‍රදානලාභියා විසින් පදනම වෙත නැවත ලබාදිය යුතු වුවත් 2018 සැප්තැම්බර් වන විටත් ව්‍යාපෘතිය අවසන් වී මාස 9 ත් මාස 14 ත් අතර කාලයක් ගත වී තිබූ පර්යේෂණ 05 කට අදාලව රු.789,587 ක් වූ ඉතිරි මුදල පියවා නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

2015 මැයි 15 දිනැති අංක මු.අ. 01/2015/01 දරන මුදල් චක්‍රලේඛයේ 4(අ)(1)(iii) වගන්තියට අනුකූල නොවන පරිදි විදේශ ගමන් සඳහා සංයුක්ත දීමනා ගෙවීමේදී දෙවන ගණය අදාලවන නිලධාරීන් සඳහා පළමු ගණය අදාල කර ගෙන සංයුක්ත දීමනා ගෙවීම් කිරීම හේතුවෙන් නියැදි විගණන පරීක්ෂාවට අනුව, සමාලෝචිත වර්ෂයේ අවස්ථා 16 කදී රු.1,636,220 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පදනමේ මූල්‍ය ප්‍රතිඵලය රු.17,990,480 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,931,059 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.15,059,421 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ලැබීම් රු.2,339,000කින් හා වෙනත් ආදායම් රු.5,974,000කින් වැඩි වී තිබූ නමුත් ව්‍යාපෘති වියදම් රු.19,491,000 කින් හා වෙනත් වියදම් රු.3,402,000 කින් වැඩි වී තිබීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2013 හා 2014 වර්ෂවලදී මූල්‍ය ප්‍රතිඵලයෙහි අතිරික්තයක් ඇති වී තිබූ නමුත් 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වාම ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ දී රු.77,199,333ක් වූ පදනමේ දායකත්වය 2017 වර්ෂය වන විට රු.78,807,181ක් දක්වා වර්ධනය වී තිබූ නමුත් 2016 වර්ෂය හා සැසඳීමේ දී 2017 වර්ෂයේ දායකත්වය රු.17,325,454 කින් අඩුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්ය සාධනය

-------------------

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 10 වගන්තියෙහි සඳහන් පදනමෙහි අරමුණුවලට අදාලව ඉටු කළ යුතු ප්‍රධාන කාර්යයන් 6 ක් යටතේ සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඒ සඳහා රු.මිලියන 260 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. එහෙත් එම ප්‍රධාන ක්‍රියාකාරකම්වලට අදාලව හඳුනාගෙන තිබූ උප ක්‍රියාකාරකම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයන් වෙන් වෙන් වශයෙන් දක්වා නොතිබූ බැවින් එම උප ක්‍රියාකාරකම්වල මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් ඇගයීමට ලක් කළ නොහැකි විය.

(ආ) 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේදී ප්‍රදාන වටිනාකම රු.මිලියන 214.75 ක් වූ තරගකාරී පර්යේෂණ ප්‍රදාන (Competitive Research Grants) ව්‍යාපෘති 112 ක් අවසන් කර තිබූ අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉහත පර්යේෂණ ව්‍යාපෘතිවලින් ප්‍රදාන වටිනාකම රු.14,552,858 ක් වූ ව්‍යාපෘති 5 ක් පමණක් වාණිජකරණය කල හැකි බවට හඳුනාගෙන තිබූ අතර ප්‍රදාන වටිනාකම රු.8,068,692 ක් වූ පර්යේෂණ ව්‍යාපෘති 3 ක් පමණක් පේටන්ට් ලබා ගැනීම සඳහා යොමු වී තිබුණි.

(ii) ප්‍රදාන වටිනාකම රු.69,780,007 ක් වූ ව්‍යවහාරික විද්‍යා (Applied Science) පර්යේෂණ ව්‍යාපෘති 31 ක් සම්බන්ධයෙන් ප්‍රදානලාභීන්ගේ අදහස් දැක්වීම් අනුව, පර්යේෂණ ප්‍රතිඵලයන් කෘෂිකර්මය, සෞඛ්‍ය, ජෛව තාක්ෂණ, පාරිසරික විද්‍යා හා බලශක්ති යන ක්ෂේත්‍රයන් සඳහා යොදාගත හැකි බව දක්වා තිබුණි. එහෙත් සත්‍ය වශයෙන් එම ක්ෂේත්‍රවලට පර්යේෂණ ප්‍රතිඵල යොදාගෙන තිබේද, ප්‍රතිපත්ති සම්පාදනයන් සඳහා යොමුකර තිබේද, එනයින් ආර්ථික හා සමාජීය සංවර්ධනය සඳහා කෙසේ දායකවී තිබේද යන්න පිළිබඳ පශ්චාත් ඇගයීමක් පදනම විසින් සිදු කර නොතිබුණි.

(ඇ) ජාතික තේමා මූලික පර්යේෂණ වැඩ සටහන- ආහාර සුරක්ෂිතතාවය

-----------------------------------------------------------------------------

ව්‍යාපෘතිවල ප්‍රතිඵලය ජාතික සංවර්ධනය සඳහා යොදා ගැනීමේ අරමුණින් 2012 වර්ෂයේදී ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව ව්‍යාපෘති 9ක් ක්‍රියාත්මක කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රදාන වටිනාකම රු.22,746,297 ක්වූ ව්‍යාපෘති 7ක් අවසන් වී තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පර්යේෂණ පිරිවැය රු.1,850,820 ක්වූ වෙබ් අඩවිය හරහා අස්වනු පිළිබඳ පුරෝකථනයන් සිදු කිරීමේ ජාල පද්ධතියක් සංවර්ධනය කර එය ක්‍රියාත්මක කිරීම සඳහා 2016 සැප්තැම්බර් මාසයේදී කෘෂිකර්ම අමාත්‍යාංශයට පවරා දී තිබුණි. නමුත් එම ජාල පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක වන්නේ ද ගොවීන් ඒ හරහා ප්‍රතිලාභ ලබන්නේද යන්න පිළිබඳව 2018 මැයි වන විටත් පදනම විසින් පසු විපරමක් සිදු කර නොතිබුණි.

(ii) අවශ්‍ය තොරතුරු අවශ්‍ය වේලාවට ලබා දීම හා වඩාත් හොඳ අධීක්ෂණයක් හා නිෂ්පාදන කළමණාකරණයක් මගින් ජනගහනයේ වෙනස් වන ආහාර ඉල්ලුම සැපිරීම සඳහා ගොවීන්ට හැකියාව ලබා දෙන සමාජ ජාලයක් නිර්මාණය කිරීමේ පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා රු.5,545,484 ක් වැයකර තිබූ අතර එය 2016 ඔක්තෝබර් මාසයේදී අවසන් කර තිබුණි. එහෙත් මෙම පර්යේෂණයේ අපේක්ෂිත ප්‍රතිලාභ ලඟාකර ගැනීම සඳහා වූ 2018 මැයි වන විටත් අදාල සමාජ ජාල පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ආයතනයකට පැවරීම සිදු කර නොතිබුණි.

(iii) පෙර අස්වනු තාක්ෂණයන් යොදා ගැනීම තුලින් ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම හා පොටෑසියම් හා සිලිකන් පසට යෙදීම මගින් නැවුම් නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා රු.5,588,453 ක් වැයකර තිබුණි. තවද, තරඟකාරී පර්යේෂණ ප්‍රදාන යටතේද සිලිකන් හා දහයියා භාවිතයෙන් මාලු මිරිස්වල, පෙර හා පසු අස්වනුවල ගුණාත්මකභාවය ස්වභාවිකව ආරක්ෂා කිරීම පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා රු.1,462,500 ක ප්‍රදානයක් ඉහත පර්යේෂණය සිදු කළ ආයතනයටම ලබා දී තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේදී මෙම ව්‍යාපෘති දෙක ම අවසන් වී තිබූ නමුත් මෙම ක්‍රමය භාවිතා කරනු ලබන ප්‍රදේශ කවරේද, මෙම ක්‍රමය හඳුන්වා දීම සඳහා විධිමත් වැඩ පිළිවලක් ක්‍රියාත්මක වේද ඒ සඳහා වගකීම භාරගත් ආයතනයන් හඳුනාගෙන තිබේද, මහජනතාව අතර කොතරම් ප්‍රචලිත වී ඇත් ද, සහ ලබන ප්‍රතිලාභ කවරේද යන්න පිළිබඳ පසු විපරමක් පදනම විසින් සිදු කර නොතිබුණි.

(iv) ප්‍රදාන වටිනාකම රු.3,470,640 ක් වූ පර්යේෂණ ව්‍යාපෘති දෙකක් සමාලෝචිත වර්ෂයේදී අවසන් කර තිබුණු අතර එම පර්යේෂණ ව්‍යාපෘතිවලින් ක්ෂුද්‍රජීව විද්‍යාත්මක ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා ජාතික පද්ධතියක් ස්ථාපිත කිරීම හා ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයෙන් පෙලෙන ප්‍රදේශ සඳහා ගෘහස්ථ ආහාර සුරක්ෂිතතා ආදර්ශ සංවර්ධනය කිරීම අපේක්ෂා කලද එය ඉටුකර ගත හැකිවී නොතිබුණි.

(ඈ) පර්යේෂණ ප්‍රදාන ලබා දීමට අදාළ ගිවිසුමේ 5.1 වගන්තිය ප්‍රකාරව, ව්‍යාපෘතිය නිම කර මාස 3 ක් ඇතුළත අවසන් වාර්තාව ඉදිරිපත් කළ යුතු වුවත් රු.31,783,609 ක් වූ නිම කළ ව්‍යාපෘති 17 ක් සඳහා අවසාන වාර්තාව ලබා දීමේදී මාස 3 සිට මාස 19 ක් දක්වා කාල ප්‍රමාදයක් සිදු වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී තාක්ෂණ ප්‍රදාන 14 ක් සඳහා රු.11,408,536 ක අරමුදල් ලබා දී 2018 සැප්තැම්බර් මාසය වන විට මාස 12 සිට මාස 20 දක්වා කාලයක් ගත වී තිබුණද අදාල ප්‍රදානයන් කාර්යක්ෂමව හා ඵලදායීව අරමුණු කරා ලඟා වීමට යොදාගෙන තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා එම ව්‍යාපෘතිවල කාර්ය සාධනය භෞතිකව පරීක්ෂාකර නොතිබුණි.

(ඊ) උපකරණ ප්‍රදාන ලබාදීම සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රතිපාදන ලබාදී මාස 6 ක් තුළ උපකරණ මිලදී ගත යුතු වුවත් 2016 දෙසැම්බර් 20 දින රු. 2,100,000 ක ප්‍රදානයකට අදාල උපකරණ මිලදී ගැනීම 2018 සැප්තැම්බර් වන විටත් සිදුකර නොතිබුණි. එබැවින් අරමුදල් වෙනත් ආයතනයක වර්ෂ 1 මාස 9 ක කාලයක් නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

**4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රදානය කර තිබූ පර්යේෂණ ව්‍යාපෘති 22 ක් අතුරින් රු.22,198,794 ක් වටිනා ව්‍යාපෘති 7 ක් සඳහා 2018 මැයි වන විටත් අරමුදල් ලබා දී නොතිබූ අතර රු.5,353,815 ක් වටිනා උපකරණ ප්‍රදාන 6 ක් 2017 ජූලි 13 දින ලබා දී තිබුණද ඒ සඳහා අරමුදල් නිදහස් කිරීමට 2018 පෙබරවාරි 24 දක්වා මාස 7 ක කාලයක් ගතවී තිබුණි. ව්‍යාපෘති

වෙනුවෙන් උපකරණ මිලදී ගැනීම සඳහා අරමුදල් ලබාදීම ප්‍රමාද වීම නිසා එය භාවිතා කර සිදුකිරීමට අපේක්ෂිත පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය අඩුවීමටත් ඊළඟ වර්ෂයේදී ලබා දිය හැකි ප්‍රදානයන් සීමා කිරීමටත් සිදුවිය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) 2017 මැයි 12 දින රු.2,553,000 ක උපකරණ ප්‍රදානයක් පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා ලබාදී තිබුණු අතර මිල දී ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් මුදල් නැවත ලබාදෙන ලෙස 2018 පෙබරවාරි 23 දින දන්වා තිබුණද 2018 අගෝස්තු වන විටත් මුදල් ලැබී නොතිබුණි.

(ඈ) අවශ්‍යතාවය නිසි ලෙස අධ්‍යයනය කර අත්තිකාරම් ලබානොදීම හේතුවෙන් අවස්ථා 93 කදී ලබාගත් අත්තිකාරම් මුදලින් සියයට 20 සිට සියයට 100 දක්වා වූ එකතුව රු. 1,156,131 ක ප්‍රමාණයක් ඉතිරි වී නැවත පියවා තිබුණි.

(ඉ) භාවිතයට ගත නොහැකි පිරිවැය රු.205,427ක් වූ තොග අයිතම 58 ක් 2010 වර්ෂයේ සිට 2018 අගෝස්තු දක්වාම අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ජාතික විද්‍යා පදනම විසින් තම විෂය පථය යටතට ගැනෙන තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 6.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:1:1 (අ) වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘතියක් නියමිත කාලය තුල අවසන් කරන බව සහතික වීම සඳහා සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස සැලසුම් කල යුතුය. එහෙත් සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් වනවිට අවසන් කිරීමට සැලසුම් කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 71.52 ක් වූ ප්‍රසම්පාදනයන් 13කට අදාලව මූල්‍ය ප්‍රතිපාදන නොමැති වීම හා ප්‍රසම්පාදනය අවශ්‍ය අවස්ථාව නිසි ලෙස නිර්ණය නොකිරීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දින වන විටත් සිදුකර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:2:1 (ඇ) ප්‍රකාරව පදනම විසින් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුලත් කර තිබූ ගොඩනැගිලිවල තීන්ත ආලේප කිරීමේ කොන්ත්‍රාත්තුව රු.4,777,625 ක වටිනාකමකට කොන්ත්‍රාත් සමාගමකට පවරා තිබුණු අතර කලවැඩ සඳහා ගෙවීම් ලබා ගැනීමට 2018 මාර්තු 25 දින රු. 2,208,160ක බිල්පතක් ඉදිරිපත් කර තිබුණි. බිල්පතෙහි සඳහන් කල වැඩවලට අදාල වර්ග අඩි ප්‍රමාණය භෞතිකව පරීක්ෂා කිරීමේදී එම අගය හා බිල්පතෙහි සඳහන් වර්ග අඩි ප්‍රමාණයන්හි වෙනස්කම් නිරීක්ෂණය විය. ඒ අනුව රු.699,413ක් වැඩිපුර ඉන්වොයිස්කර තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිනියගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ලිපිගොනු පාලනය | පෞද්ගලික ලිපි ගොනුවල ඇතුලත් සහතිකපත්වල නිරවද්‍යතාවය අදාල ආයතනවලින් තහවුරුකර නොගැනීම හා දිවුරුම හෝ ප්‍රතිඥාව හා වෛද්‍ය වාර්තා ලිපිගොනු තුළ නොවූ අවස්ථා පැවතීම. |
| (ආ) පර්යේෂණ ප්‍රදාන ලබාදීම හා අධීක්‍ෂණය | අවසන් කළ ව්‍යාපෘතිවලට අදාල ඉතිරි මුදල් ලබා ගැනීමේදී ප්‍රමාදයන් පැවතීම. |
| (ඇ) ප්‍රසම්පාදනය | (i) ප්‍රසම්පාදනයන් ඉටුකිරිමේ ප්‍රගතිය සමාලෝචනය කර ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන නොකිරිම. |
| | (ii) කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹීමේදී ප්‍රමාදයන් සිදුවීම. |
| (ඇ) තොග පාලනය | (i) ඉන්වෙන්ට්‍රි ලේඛන යාවත්කාලීනව පවත්වා නොගැනීම. |
| | (ii) පුස්තකාල පොත්/ප්‍රකාශන සහ භෞතිකව පවතින පොත්/ලේඛන අතර වෙනස්කම් පැවතීම. |
| | (iii) තොග ගබඩාව ක්‍රමවත්ව නඩත්තු කර නොතිබීම. |
| | (iv) යල් පැන ගිය හා අපහරණය කල යුතු භාණ්ඩ ඉවත් කිරීමට කටයුතු නොකිරීම. |
| | (v) හඳුනාගැනීමේ අංකයක් සටහන් කර නොමැති වත්කම් පැවතීම. |
| | (vi) ගබඩාවට මාරු කළ යුතු බව ඉන්වෙන්ට්‍රි ලේඛනවල දක්වා ඇති භාණ්ඩ භෞතිකව පැවතීම. |
| (ඉ) අත්තිකාරම් පාලනය | කිසිදු කාර්යයක නොයොදවා ලඟ තබාගෙන මුදල් අත්තිකාරම් පියවා තිබූ අවස්ථා පැවතීම. |